# කොළඹ විශ්ව විද්‍යාලය

## ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය- II වන සෙමෙස්තරය - 2017/2018

## HIS 4292- ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ඉතිහාසය පිළිබඳ කතිකා විශ්ලේෂණයක්

කාලය පැය (02) දෙකයි

**ඕනෑම ප්‍රශ්න (03) තුනකට පිළිතුරු සපයන්න**

1. ඓතිහාසික විමර්ශනය පිළිබඳ දැනුම් ක්ෂේත්‍රය 'ශාස්ත්‍රීය' සහ 'ජනප්‍රිය' ලෙස බෙදා දැක්වීම කොයි තරම් දුරට ප්‍රයෝජනවත් ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

2. මෑතකාලීන ලංකාව තුළ ඉතිහාසය සඳහා වන ජනප්‍රිය ඉල්ලුම පැහැදිලි කරන්නේ කෙසේ ද? විචාරාත්මකව විමසන්න.

3. ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

   අ). අනගාරික ධර්මපාලගේ 'පැරණි ශිෂ්ටාචාරයක ඉතිහාසය' පඨිතයේ මූලික කතිකාමය ලක්ෂණ මොනවා ද?

   ආ). එම පඨිතය ජනප්‍රිය ඉතිහාස කතිකාවට අයත් වන්නක් ලෙස සැලකිය හැකි ද?

4. 'ජයන්ත චන්ද්‍රසිරිගේ 'මහරජ ගැමුණු' නවකතාව මහාවංසය සහ සිංහල-බෞද්ධ ජාතිකවාදී ඉතිහාස කතිකාව අතර පැවැති සම්ප්‍රදායික සම්බන්ධයේ ඇතැම් ආතතීන් හෙළිදරව් කරයි.' මේ ප්‍රකාශය විමසන්න.

5. 'ජැක්සන් ඇන්තනී ගේ 'මහා සිංහලේ වංස කතාව' මෙතෙක් වෙන් වෙන් ව පැවැති ඉතිහාස කතිකා කිහිපයක් එක් කතිකාවක් තුළට ගෙන ඒමට වෑයම් කරයි'. මේ ප්‍රකාශය විවේචනාත්මක ව විභාග කරන්න.

6. රාවණා පුරාවෘතය සම්බන්ධයෙන් මෑත කාලීනව ඇති වී තිබෙන උනන්දුව විස්තර කරන්න.